**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සිංහල භාෂා අංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය- 2023**

පද්‍ය නිර්මාණය හා අවබෝධය

8 ශ්‍රේණිය

**කාලය පැය 1 විනාඩි 30**

1 කොටසට අයත් සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii කොටසේ (අ) ,(ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

**I කොටස**

(1) " ඉගෙනුම අප දිවි සරසයි" යන වැකිය පද මාරු කරමින් මෙසේ ලිවිය හැකිය.

ඉගෙනුම අප දිවි සරසයි
අප දිවි සරසයි ඉගෙනුම
සරසයි දිවි ඉගෙනුම අප
ඉගෙනුම සරසයි දිවි අප

මෙය ආදර්ශයට ගෙන අර්ථයට බාධාවක් නොවන සේ පහත දැක්වෙන වැකි වල පද මාරු කරමින් ලියන්න.

I. නිල් අහසේ සඳ බැබළෙයි
II. තුරුලිය සනහයි මිහිකත
III. ඇල් පවනේ සිසිල ගෙනේ
IV. සුවඳ මලින් මුනිඳු පුදමු
V. ඇවිද්ද පය දහස් වටී (ලකුණු 10 යි)

(02) හිස්තැනට සුදුසු අර්ථවත් කවි පද යොදා සම්පූර්ණ කරන්න.

I. සුදු වලා නැග එයි
විහඟුන් මිහිරි නද දෙයි
...............................................
............................................... (ලකුණු 02 යි)

2. සුළඟ හමයි හෝ හඬ එයි
අකුණු ගසයි එළි විහිදයි
........................................................
. ...................................................... (ලකුණු 02 යි)

3. උණුසුම සිසිල සොමි ගුණ පිරි පින් බිමකි
දාගැබ් මහා වැව් තැනවුණු ජය බිමකි
......................................................
...................................................... (ලකුණු 03 යි)

4. දුක් කම් කටොලු දහසක් ඉසිලූ අම්මේ

මගෙ දිවි සැරියෙ හිරු සඳු වේ ඔබ        අම්මේ

...................................................................

...................................................................

(ලකුණු 03 යි)

(මුළු ලකුණු 10 යි)

(03) පහත දී ඇති නිදසුන අනුව සමානරූපී වචන ඉදිරියේ ඇති හිස් කොටු වල ලියන්න.

නිදසුන.

| නයන | ගයන | වයන | සයන | ලියන |
|---|---|---|---|---|
| කවට | | | | |
| කතර | | | | |
| මල්ල | | | | |
| තුරු | | | | |

(ලකුණු 08 යි)

(04) පහත දැක්වෙන කවිපැන වලට පිළිතුරු කවිය බැගින් ලියන්න.

පොත පත වැඩ එමට

ගොඩ ගැසී තිබුණත් ළඟ

පරිගණක තිරයට

අනේ මන් සමු දෙන්නෙ කොහොමද?

...................................................................

...................................................................

...................................................................

...................................................................

ඉල්ලන දේවල් නොඅඩුව ලැබ        දෙන

අල්ලන අතැඟිලි ඉමහත්        පේමෙන

මල් මදහස නිති මුව මත        උතුරන

දෙවියන් කවුරුද අප ළඟ        ගැවසෙන

...................................................................

...................................................................

...................................................................

...................................................................

(ලකුණු 12 යි)

(05) පහත දැක්වෙන චිත්‍රය නිරීක්ෂණය කොට කැමති විරිතක් අනුව පදා 4 ක් නිර්මාණය කරන්න.



II කොටස

(අ) ,(ආ) කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

- ❖ පහත දැක්වෙන කවි කියවා දී ඇති මාතෘකාව අනුව පද්‍ය 5 කට නොඅඩු කාව්‍ය නිර්මාණයක් කරන්න.

1. මුදු සුවඳින් දස දෙස පුරවන්නට

හිරු කුමරුන් දැක රුවට පිපෙන්නට

බුදු හිමි සිරිපා පියුම පුදන්නට

සංසාරේ කළ පින මදි විද මට

(බිම් මලක් වැළපෙයි)

2. ගහ වැල පණ පොවා

දුරු කර සා පිපාසා

අප රකින සැමදා

ජලය නොරකිනු ඇයි ද මිනිසා

(ජල සම්පත සුරකිමු )

3. හිරු කිරණ විදිමින

පීදෙන මල් කැකුළු මෙන

අසා ගුරු ඔවදන

වන්න හොඳ දරුවෙක්ම නිතියෙන

(හොඳ ළමයා )

(ලකුණු 50 යි)

(ආ) ඔබේ පන්තියේ සිටින හොඳම මිතුරාට /මිතුරියට දැඩි අසනීපයක් වැළඳී ඇතැ'යි ඔබට දැන ගන්නට ලැබේ. එය දැන ගත් ඔබට දැනෙන සිතුවිලි කවි 5 කින් දක්වන්න.

නැතහොත්

හිරු එළිය- විහඟ ගී -අලුයම -මද පවන ... ආදී තොරතුරු ඇතුලත් කරමින් "සුන්දර උදෑසන" යන මාතෘකාවට කවි 5 ක් ලියන්න.

(ලකුණු 50 යි)